# ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය - 2019


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## ජාතික සෞභාග්‍යය

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය[1], 2018 වසරේ වාර්තා කළ 0.811 ක අගයට සාපේක්ෂව 2019 වසරේ දී 0.802 ක අගයක් වාර්තා කරන ලදී. මේ සඳහා 'ආර්ථික සහ ව්‍යාපාර පරිසරය' සහ 'සමාජ-ආර්ථික යටිතල පහසුකම්' යන උපදර්ශකයන්හි පහළ යෑම හේතු වී ඇති අතර 'ජන ජීවිතයේ යහපැවැත්ම' උපදර්ශකය මෙම වසර තුළ දී වැඩිදියුණු වී ඇත.

| | 2018 | 2019 |
|---|---|---|
| ***ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය*** | ***0.811*** | ***0.802*** |
| ***උපදර්ශක*** | | |
| ***ආර්ථික සහ ව්‍යාපාර පරිසරය*** | *0.891* | *0.784* |
| ***ජන ජීවිතයේ යහපැවැත්ම*** | *0.554* | *0.688* |
| ***සමාජ-ආර්ථික යටිතල පහසුකම්*** | *0.989* | *0.934* |

**රූප සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකයෙහි සහ එහි උපදර්ශකවල විචලනයන්: 2015 – 2019**




**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

සංචාරක හා ඒ ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් ඇති වූ බලපෑම මත විරැකියාව ඉහළ යෑම සහ 2019 වසරේ අග භාගයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් පදනම් කොටගෙන සාපේක්ෂව ඉහළ උද්ධමනයක් වාර්තා වීම, ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

පාස්කු ප්‍රහාරයෙන් පසුව ආරක්ෂාව පිළිබඳව ඇති වූ අවිනිශ්චිතතාවය සමඟ පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතය අඩු වීම, සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ පහළ යෑම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය විය.

සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම්වල ගුණාත්මකභාවය සහ මහජනතාවගේ වත්කම් යන අංශවල ඉහළ වර්ධනය, ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකයේ ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය.

**රූප සටහන 2 – සෞභාග්‍යතා දර්ශකය මඟින් ආවරණය වන අංශ**





**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

[1] ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය යනු රටෙහි සෞභාග්‍යය මැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන බහුමාන දර්ශකයකි. මෙම දර්ශකය, සෞභාග්‍යය මනිනු ලබන විවිධ අංශ නියෝජනය කරන විචල්‍යයන් 41 ක් යොදා ගනිමින් ගණනය කරනු ලබන ආර්ථික සහ ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් සමන්විත වේ.

## පළාත්බද සෞභාගයය

පළාත්බද සෞභාග්‍යතා දර්ශකයෙහි ඉහළම අගය සනිටුහන් කරමින්, බස්නාහිර පළාත ප්‍රමුඛස්ථානය අත්පත් කරගත් අතර දකුණු සහ මධ්‍යම පළාත් පිළිවෙළින් දෙවන සහ තෙවන ස්ථාන ලබා ගත්තා ලදී. පෙර වසර හා සැසඳීමේ දී, සෞභාග්‍යතා දර්ශකයෙහි වැඩිම ඉහළ යෑම් වාර්තා වූයේ, පිළිවෙළින්, උතුරු මැද, නැගෙනහිර සහ බස්නාහිර යන පළාත් වලිනි.

රූප සටහන 3 - පළාත්බද සෞභාග්‍යතා දර්ශකය: 2018- 2019




සංඛ්‍යා සටහන 1 - පළාත්බද සෞභාග්‍යතා දර්ශක සහ පළාත්බද ශ්‍රේණි

| | *දර්ශක අගය* | | *පළාත්බද ශ්‍රේණිය* | |
|---|---|---|---|---|
| | **2018** | **2019** | **2018** | **2019** |
| මධ්‍යම | 0.438 | 0.386 | 3 | 3 |
| නැගෙනහිර | 0.087 | 0.107 | 8 | 8 |
| උතුරු මැද | 0.220 | 0.249 | 7 | 7 |
| වයඹ | 0.406 | 0.373 | 4 | 4 |
| උතුරු | 0.305 | 0.310 | 5 | 5 |
| සබරගමුව | 0.281 | 0.254 | 6 | 6 |
| දකුණු | 0.533 | 0.458 | 2 | 2 |
| ඌව | 0.083 | 0.025 | 9 | 9 |
| බස්නාහිර | 1.597 | 1.615 | 1 | 1 |

**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

## පළාත්බද සෞභාග්‍යතා උපදර්ශකයන්හි කාර්ය සාධනය

### ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය

අවිධිමත් අංශයේ වැටුප් සහ විධිමත් අංශයේ සේවා නියුක්තිය වැඩිවීමත් සමඟ නැගෙනහිර, උතුරු මැද, උතුරු සහ ඌව පළාත් තුළ මෙම උපදර්ශකය වැඩිදියුණු වී ඇත. අනෙකුත් පළාත් තුළ උපදර්ශකයේ පහළ යෑම කෙරෙහි සේවා නියුක්තිය අඩු වීම සහ ඉහළ උද්ධමන අගයන් පැවතීම ප්‍රධාන වශයෙන් හේතු විය.

### ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය

දකුණු පළාත හැර අනෙකුත් සියලු පළාත්වල මෙම උපදර්ශකයේ වැඩි වීමක් දැකිය හැකි අතර ඒ සඳහා ප්‍රමුඛ දායකත්වය, සෞඛ්‍ය හා අධ්‍යාපනය ක්ෂේත්‍ර වල ගුණාත්මකභාවය සහ ජනතාවගේ වත්කම් මනිනු ලබන වාහන හිමිකාරීත්වය හා සුපිරි වෙළඳසැල් සඳහා වන ප්‍රවේශය යන සාධකවල වැඩිදියුණු වීම මගින් ලබා දෙන ලදී. මේ අතර, දකුණු පළාත තුළ උපදර්ශකයේ සුළු පහළ යෑමට, විනෝදාස්වාදය හා අධ්‍යාපනය යන අංශවල සහ පාරිසරික සාධකවල ඇති වූ යම් පසුබෑම හේතු වී ඇත.

### සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය

මෙම උපදර්ශකයේ ඉහළ යෑම්, දකුණු සහ බස්නාහිර පළාත් තුළින් වාර්තා වූ අතර, ඒ සඳහා මාර්ග පද්ධතිය, විදුලිබල පහසුකම් සහ අපරාධවලින් තොර පරිසරයක් පැවතීම යනාදියෙහි වැඩිදියුණු වීම් දායක විය. ඌව පළාතෙන් වාර්තාවන මෙම උපදර්ශකයේ ඉහළම අඩු වීම සඳහා මෙන්ම, අනෙකුත් පළාත් තුළ ද උපදර්ශකයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රවාහන පහසුකම් සහ ආරක්ෂිත පානීය ජල පහසුකම් පැවතීම යන සාධකවල ඇති වූ පසුගාමී තත්ත්වයයි.

සංඛ්‍යා සටහන 2 - පළාත්බද සෞභාග්‍යතා උපදර්ශක [2]

| | **2018** | **2019** |
|---|---|---|
| ***ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය*** | | |
| මධ්‍යම | 0.453 | 0.348 |
| නැගෙනහිර | 0.127 | 0.146 |
| උතුරු මැද | 0.411 | 0.532 |
| වයඹ | 0.542 | 0.467 |
| උතුරු | 0.359 | 0.463 |
| සබරගමුව | 0.333 | 0.151 |
| දකුණු | 0.518 | 0.212 |
| ඌව | 0.134 | 0.197 |
| බස්නාහිර | 1.860 | 1.829 |
| ***ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය*** | | |
| මධ්‍යම | 0.157 | 0.176 |
| නැගෙනහිර | -0.075 | -0.028 |
| උතුරු මැද | 0.224 | 0.253 |
| වයඹ | 0.338 | 0.365 |
| උතුරු | 0.236 | 0.241 |
| සබරගමුව | 0.287 | 0.369 |
| දකුණු | 0.499 | 0.490 |
| ඌව | -0.091 | -0.047 |
| බස්නාහිර | 1.163 | 1.198 |
| ***සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය*** | | |
| මධ්‍යම | 0.703 | 0.636 |
| නැගෙනහිර | 0.210 | 0.204 |
| උතුරු මැද | 0.026 | -0.038 |
| වයඹ | 0.336 | 0.287 |
| උතුරු | 0.319 | 0.226 |
| සබරගමුව | 0.224 | 0.242 |
| දකුණු | 0.583 | 0.671 |
| ඌව | 0.207 | -0.075 |
| බස්නාහිර | 1.769 | 1.819 |

[2] දර්ශක අගයන් ගණනය කිරීමේ දී සියලුම විචල්‍යයන් ඒවායේ පසුගිය වසර 10 හි දත්ත යොදා ගනිමින් සම්මතකරණය කරනු ලබයි. එම නිසා දර්ශක අගයේ සලකුණ මගින් අදාළ මධ්‍යනයයට සාපේක්ෂව එහි ධන හෝ ඍණ වෙනස්වීම පිළිබිඹු කරන අතර දර්ශකයේ ඍණ අගයන් මගින් සෞභාග්‍යතාව ඍණ මට්ටමක පවතී යැයි පිළිබිඹු නොවේ.

**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

## තාක්ෂණික සටහන:

### සෞභාග්‍යතා දර්ශකය

උපදර්ශක 3 ක් යටතේ වර්ගීකරණය කරන ලද විචල්‍යයන් 41 ක් යොදා ගනිමින් සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කරනු ලබන අතර ප්‍රධාන දර්ශකය තුළ සියලුම උපදර්ශක සඳහා සමාන බර තැබීම් ලබා දී තිබේ.

ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය මිල ස්ථායීතාව, ජීවන තත්ත්වය, ආදායම, දරිද්‍රතාවය, සේවා නියුක්තිය, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය ලෙස වර්ග කරනු ලැබූ විචල්‍යයන් 9 ක් භාවිතා කරමින් සම්පාදනය කරනු ලැබේ. ජන ජීවිතයේ යහපැවැත්ම පිළිබඳ උපදර්ශකය ගණනය කිරීමේ දී, සෞඛ්‍ය පහසුකම් පැවතීම, අධ්‍යාපන පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, වත්කම්, විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා එහි භාවිතය, වායුගෝලයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදු බව යන අංශයන්ට අදාළව විචල්‍යයන් 22 ක් භාවිතා කරනු ලැබේ. සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය විචල්‍යයන් 10 කින් සමන්විත වන අතර, එමගින් ප්‍රවාහන පහසුකම් පැවතීම, මහා මාර්ග පහසුකම් පැවතීම, විදුලි සංදේශ පහසුකම් පැවතීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් පැවතීම, විදුලිබල පහසුකම් පැවතීම, ආරක්ෂිත පානීය ජල පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහ අපරාධවලින් තොර පරිසරයක් පැවතීම, යන පැතිකඩ ආවරණය වේ.

### ක්‍රමවේදය

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනයේදී යොදා ගන්නා විචල්‍යයන් විවිධ මිනුම් ඒකක මගින් ගණනය කරනු ලබයි. එම නිසා සියලුම විචල්‍යයන්ගේ පසුගිය වසර 10 හි දත්ත, සම්මතකරණය මගින් පොදු පරිමාණයකට සකසා ගනු ලැබේ. සමස්ත රටෙහි හා පළාත්වල දර්ශක වෙන් වෙන් වශයෙන් සම්පාදනය කර ඇති බැවින් පළාත් දර්ශක, ජාතික මට්ටමේ දර්ශකය සමඟ සංසන්දනය කළ නොහැක. ඒ අනුව, පළාත් මට්ටමේ දර්ශක, පළාත් එකිනෙක අතර හා කාලය සමඟ සංසන්දනය කළ හැකි අතර ජාතික මට්ටමේ දර්ශකය කාලය සමඟ පමණක් සංසන්දනය කළ හැක.